



එළිය වැඩියේ පොඩියන් ගේ එළි වඩන්නට යි.

කලබෙකැ මිල සත දහය යි.
දෙලොස් කලබෙකැ මිල රුපියල් එක යි සත පණහ යි.
පහිණ යොමුව :- උණවටුනේ 'හේලි' පහරුයේ, එළියේ අදියුරු.

# දැය අපේ !

පුන- ගැයිය { දැය අපේ - හෙළයනේ
රකිමු පණ වගේ

1. අසුර රකුස්, ඇ නමින්
ලොවෙහි පතල වී
මද්දහනේ ඉර, වගේ
තෙද පැ පැ —
බැබැළි දැය අපේ !

2. හතුරු වැ කිසිවකු එති යි
කනට වන් වහා
මහට මැ ගොස් උන් තසා
හෙළෙඹි පැ —
හේලි දැය අපේ !

3. ලෙයින් මුහුදු මවා–පා
මසින් කඳු හදා
අපේ මුතුන් රණ බිමේ
වැපිවැපී —
සුරකි දැය අපේ !

4. පුදුම පිළිම, ඇසිරි රූ
මුහුදු සදිසි වැවු තැනූ -
මහ දැගැප්, මාළිගා
නම තබා —
මැවූ දැය අපේ !

5. රුපුන් ලා මැ සිවු දිගේ
තෙද යස කියවා
ලියැවූ පත් පොත් බොහෝ
විරයන් –
වැඩූ දැය අපේ !

6. මහ මුහුද යි අප වටා
යන්න තැනෙක් නැ
පරයන් පර තෙර යවා
හෙළයනේ —
රකිමු දැය අපේ !

3 වෙළුම | 2496 නිකිනි / 1952 අගෝස්තු | 7 කලබ

# මාදිලි හසුන්

[ Model Letters ]

**1. ශෝලයෙක් හසුනක් යවයි සිය ගුරුතුමට නිවාඩුවේ දී.**

1952 මැයි 12
දෙහිවල - නිසාපේ,
මිහිර.

ආයිබෝ වන්!
හිතවත් ගුරු තුමෙනි,

මා ඔබට හසුනක් එවන්න හිතා උන්නේ මෙයට බොහො ම කලින්. එය වැළැකුණේ තාත්තා අප හා අනුරපුරේ ගිය නිසා ය. සති දෙකක් ම අප එහි නැවැතී උන්නා.

අපේ පැරණි මුතු - මිත්තන් ගේ තරම මට තේරුණේ එහි දී. අපේ පඩු අබා මුත්තණුවන් ගැන, ගැමුණු මුත්තණුවන් ගැන ඔබ කියූ ඒ පුදුම කතා ඇත්ත බව දැන් වැටැහෙනවා. ඒ හේළි බීම මතක් වන විට දැනුත් මගේ ඇගේ ලේ හුණු වෙනවා. අනෝ! එදත් මෙදත් සිංහලයා ගේ වෙනස.

ගෙදර දී කරන්න ය කියා ඔබ දුන් වැඩ පටන් ගත්තේ ඊයේ. නිවාඩුව සමග ම ඒ වැඩ ඉවර වේ යැ යි මා හිතනවා.

ඔබට සියලු අතින් රසවත් වූ නිවාඩුවෙක් වේ වා !

මෙයට,
ළැදි,
**සමන්.**

**2. ගුරු තුමා පිළිතුරු ලියයි.**

1952 මැයි 15 දිනැ
ගල්කිස්සේ,
සාන්ත තොමෝසු විදු හලේ දී යැ.

දිනේ වා !

දයා බර සමන් !

ලැබිණි ඔබ ගේ හසුන. පින් ! පිළිතුරු මා අතැ රැඳී-ගත්තා මදක් මැඩි සේ යැ. කමන්නැ.

ඔව්, සමන් සිංහලයකු වුණොත් අනුරා පුරේ යන්නට මැ ඕනෑ. හැබැයි එහි දී දක්නට ලැබෙන දෑයින් මැ බැහැ අපේ මුතු - මිත්තන් ගේ නියම තතු හිතා - ගන්නට. අපේ පඬු අබා මුත්තණුවන් ඔය අනුරා පුර ගොඩ නඟන්නට අවුරුදු දහස් ගණනකට ඉහත දීත් අපේ පැරැණි හෙළයන් මහ නුවරවල් ගොඩ නැංවූවා මහ හපන් කම් කළා. තරු, රවුළු, බලි ඊරණී, මාලි, මය, මිණිඇසි ඈ ඒ ඉහළ හෙළයන් ගැනැ ඔබට එන වාරයේ අසන්නට ලැබේ වි.

ඒ දුන් වැඩ සියල්ල කැරැ-ගෙනැ එන්නැ. එවිටැ ඔබට එන වාරයේ වැඩ හුඟක් මැ පහසු වන බවට මට කිසි ද සැකයෙක් නැ.

සිංහලයෙන් ඔබත් ඔබෙන් සිංහලයත් බැබැළේ වා යි පතමි.

ආසිබෝ වඳ !

මෙයට,

ළ බඳ

**ජිනදස්**

දෙහිවලැ
තිකපේ
මිහිරෙහි
**ස. තිලක්සෙන් කුමරුවෝ**

# බූ ගැහිල්ල

එඩ්වඩුවන් විසිනි

මින් හවුරුදු ස-දහසකට පමණ පෙර එක් දවසෙක කොළු සුමහස් ගණින් දිරූ විරූ හෙළයන් ලා ජය කෙළි කෙළව-මින් හෙළ දිවට හිරු උදු වියැ. එ දා ගෙහි ගෙහි නැඟුණු හිරු දද යැ, දෙරු දෙරු කෙළිනා ජය කෙළිය, එ අතින් ඇසෙන ජය සක් හඩ යැ, මෙ අතින් නැඟෙනා ජය බෙර හඩ යැ, එ මියෙන් ගැයෙන හිරු නමඳ ගී යැ, මෙ මියෙන් ගැයෙන හෙළ දු ගී යැ, එ පසින් පාන ඇසිරි විසි කරණම් යැ, මෙ පසින් පාන ඇසිරි ගී විදුම් යැ, එ හදෙහි වැවෙන පති හැඟුම් යැ, මෙ හදෙහි නිවෙන ගැති හැඟුම් යැ, එ පිටියෙහි පැවැත්වෙන මුළුයෙන් නැඟෙන හද පොපියවන විරු ගී ගැයුම් යැ, මෙ පිටියෙහි පැවැත්වෙන මුළු-යෙන් නැඟෙන හෙළ උසස පැවැසෙන උණුසුම් දෙසුම් යැ, මහසි මහ රජාණන් ගේ මහ සෙනෙවි රන්නාවන් දඹ දිව වැදූ සියලු සතුරන් නසා ජය පැන් බී පැමිණි උලෙළයෙහි බැඳී මුළු රස කෙළි දෙළෙන් මත් වැ නටනට වියැ මෙ සේ.

එහෙත් හිරු උදයෙහි දු ගුහාවන්හි රැකෙන අඳුර සේ එ තරම් මහ උලෙළයෙහිදු සිතට තහා-ගත් දුකෙකින් රහසේ තැවෙන පිරිසෙකි. අහෝ **දිකිවයා** අප නැසුවා, අපේ මුහුණේ දැළි ගෑවා, අපට දෙරට බසින්නට නැති කළා; රටේ හිටින්-නට බැරි කළා, මෙ සේ කියා මුමුනන ළ-තවන උන් අතුරු කෙනෙක් සොවින් දිළිසෙති. කෙනෙක් සොවින් කළු වෙති. කෙනෙක් කොහිද මූ ඉන්නා තැනෙකින් වහා ඇදැ දෙරට ගනු-මූ යි මහ නො ඉවැසිල්ලෙන් ගුගුරති. කෙනෙක් මූන් දෙන්නා මැ එක තැනැ තබා මරමු යි මහ ඇවිසිල්ලෙන් පිපිරෙති. මෙ සේ ඒ දිකිවයා ගේ මා පිය දෙ පසෙහි නැයන් අතුරු කුළු සිරිත් රැකීයෝ ද ගුණ දහම් පැකුවෝ ද දැ ඇලුම් වැවූවෝ ද එ නෙක් කිසි කලෙක තම පරපුරේ කිසිවකු ගෙන් සිය රැසට නො පැමිණි මහ මිදි කළක් පැමිණැවූ ඒ දිකිවයා අල්ලන්නට සිවු දිග බලා නැඟී ගියහ.

අඩ හෝරාවෙකුත් නො ගියේ යැ. දිකිවයා ගේ මා පිය දෙ පරපුරේ නැයෝ මැ උගත් උගේ "වොල්" (වොළ දෙශයෙහි දෙමළ ගැහැණිය) බිරියක් වහා අල්ලා-ගත්හ. යළි මහ පිරිය-

කාට ගෙනැ අවුත් උන් දෙදෙන එකට බැඳැ මැදින් සිටැවූ හ. දෙ පසට බෙදුණෝ යැ, හෙණ පිට හෙණ ගසන කලෙකැ මෙන් ගල් ගසා උන් දෙදෙන එහි මැ මරා ලූහ. එ පමණින් වත් සැනැසුණෝ ද හද තිවුවෝ ද ඒ ගරු විරු හෙළයෝ, නැති. හෙළයකු "චොළ්" ලියක හා බැඳුණු තැනක් දවසක් එතෙක් දිවි හිමියෙන් නොදනැ සිටි ඔහු ඒ දිකිටයා සිය පරපුරට කළ නිගායෙන් කොතෙක් විසරු වූවෝ ද, උන් දෙන්නා ගේ මළ කඳන් වටං නොයෙක් නිගැනුම් බස් කියකියා ද නැටූ හ එහි. මේ යැ බූ ගැහිල්ලේ උපත.

මේ බූ ගැහිල්ලේ දී පොල් කොහොඹු දෙකක් ගන්නේ දිකිටයාත් උගේ "චොළ්" දෙමළ බිරියත් වෙනුවට යැ. මට්ටය නමැති ලී කැබෙල්ලෙකින් හෝ එ බඳු අන් කිසිවෙකින් හෝ ඒ දෙක එකට ඇඳන්නේ උන් දෙදෙන එකට බැඳැ-ලූ බව සිහි වන්නට යැ. මෙ කොළිය කොළින්නන් දෙ පිලට බෙදෙන්නේ දිකිට-යා ගේ මා පිය දෙ පර පුරේ නෑයන් දෙ පසට බෙදුණු බව මතක් වීමට යැ. බුහුවක් හෝ එ බඳු අන් කිසිවක් හෝ ගෙනැ ගසන්-නේ ගල් ගැසූ බව පෙන්වීමට යැ. පැරදුණු පිලේ ඇත්තනට "ජල්ලි" දමන්නේ එ දා දිකිටයාටත් උගේ බිරියටත් කළ නිගැ-නුම් දක්වීමට යැ. මෙහි දී කියැවෙන "ජල්ලි" යනුත් "ජල්ලි ජකිට ජල්ලියා" යනුත් සහමුලින් වැරදි යැ ඒ මෙ සේ නිවැරදි කැර-ගන්නැ.

ජල්ලි යන්න වෙනුවට චොළ් ලිය කියා ද,
ජල්ලි ජකිට ජල්ලියා යන්න වෙනුවට
චොළ් ලිය දිකිට චොල් ලියේ කියා ද කියන්නැ-ගයන්නැ.

මේ එ දා තතු යැ. අද තතු අමුතු යැ. එ දා ඉන්දියාවේ දෙමළා සිංහල ඇහෙකැ නොගැවියැ යුත්තෙකි. එහෙත් ඒ දෙම-ළාට මැ අද ඇතැම් සිංහලයෝ සහෝදරයා යැ යි කියති. තව ඇතැමෙක් මස්සිනා යැ යි කියති. එහෙත් ඉනුත් නොනැවතුණු උගේ රිස්ස සිංහලයා ගේ බාප්පා හෝ මහප්පා හෝ වීමට යැ.

අද එ රිසි සපුරන්නට දින පතා දගස් ගණනින් දෙමළු වෝ ඉන්දියාවේ සිට හොරෙන් මෙහි එති.

## සරසවි නමඳුව — අරිසෙන් අහුබුදුවන් විසිනි

පුන { සිරි සරසවි දේවි
ගැයිය { නමඳිමි දෙව් ලිය ශේලී.

1. සව් නැණ පතිනී – කව් ලෝ මැණී
හෙළ දේවී – (සරසවි දේවී)
වැජැඹුණු දියැ දිය කෙහෙලි නහා
තරු නිරිඳුන් ගේ එක මැ නඟා
හෙළ ලලනා උයනේ සෙව්වන් දිය
නමඳිමි සරසවි දේවී.

2. මහ මෙත් පිඹුවී–යැදි කප් තුරුවී
වර දේවී – (සරසවි දේවී)
දිළිඳු දනන් සනසමින් එ දා
තුලා තුනක් දන් බරට පුදා
අසුර මුතුන් වන් මං පහයා දිලි
නමඳිමි සරසවි දේවී.

3. රූ ලෝ නාවී– * ගංමුතී දේවී
*හරි දේවී – (සරසවි දේවී)
සතුරකු ගෙන් විපතක් දකිමින්
මහ මුහුදට සිය දිවි පුදමින්
පති වත රැකැ ලූ — හිමි නම ඔප ලූ
නමඳිමි සරසවි දේවී.

4. හිරු ගොත් කුමරි – හෙළ රජ මෙහෙසී
සීදේවී – (සරසවි දේවී)
සැඩොල් වුව ද ගිලනට පත් වූ
උකුළට ගෙන හද පෑ තෙත් වූ
පින් සලකා ඔසු කොටැ සුව සැලැසූ
නමඳිමි සරසවි දේවී.

5. පියුමන් අස්නී – වීණා * වාණී
ගී දේවී — (සරසවි දේවී)
සිරි පියැ සිටැ සිය ගණන් ලිවූ
කවියෙන් එ දවසැ ඔබ මැ වැවූ
හෙළ බස සඳහා අප මෙහෙයන් නී
නමඳිමි සරසවි දේවී.

ගල්කිස්සේ
සාන්ත තොමොසු විද්‍ය හලේ දී යැ.

---

1 * ගංමුතී-සරසවිය ගේ සැමියා, හෙළ තවුසෙකි. ගඟක් අසැ තවුස් කම් කළ හෙයිනි එ නම.

2 * හරි – සුදු.

3 * වාණී – ගැහැනිය; කුවාණී (කුවේණී) යන නන්හි වාණී යනු දු මේ යැ.

තනුව:- වගුරටැ 'සෙත් නිකෙත්' සරසවියෙහි
ගිල්බාතු ගුණරුවනුන් විසිනි.

| | | | |
|---|---|---|---|
| ප ම ග රි | ස නි ද නි | ස — — — | — — — — |
| සි රි ස රි | ස වි දේ - | වී - - - | - - - - |
| නි ස රි රි | ස රි ග රි | ග ම/ ප — | — — — — |
| ත ම දි මි | දෙ වි ලි ය | හේ - ළී - | - - - - |
| ප ප ග ප | ස ස ස — | නි නි ද ප | ද — ප — |
| ස වි තැ ණ | ප ති නී - | කා වි ලෝ - | මැ - ණී - |
| ග ම ප නි | ද - - - | ද ප ග ම | ප — ප — |
| හෙ ළ දේ - | වී - - - | ස ර ස වි | දේ - වී - |
| ස රි නි ස | ග ග ග ග | ග රි ග ම | ප — — — |
| වැ ජැ ඹු ණු | දි යැ දි ය | සො හෙ ළී ත | හා - - - |
| ප ද ස රි | ග ග රි ස | නි ද ප ද | ප — — — |
| ත රු නි රි | ලු න් ගේ - | එ ක මැ ත | හා - - - |
| ප ප ම/ ප | ද — ද ද | ම — ග ම | ප ප ප ප |
| හෙ ළ ල ල | නා - උ ය | නෝ - සෙ වි | ව න් දි ය |
| ප ම ග රි | ස රි නි ස | ස — ප — | — — — — |
| ත ම දි මි | ස ර ස වි | දේ - වී - | - - - - |

# ඉරු දෙවි පැසැසුම

ද. බ. සිරිවද්ධනයන්
විසිනි

1. ඉරු දෙවියා බොහො මැ තෙදවතා
අහස් නුවරැ හරි මැ බලවතා
අඳුරු පඳුරු බිඳිත ඉසමතා
හිරු ගොත ලොව යෙදූ මුල් පිතා — දිනේ දිනින් දෑ !

2. නෙළුම් විලට බැලුම් හෙළන්නා
මහල් මලේ බිහුත් යවන්නා
කුරුලු සුතන් දෙරට වඩන්නා
ගහේ වැලේ ගෙඩි ඉදවන්නා —දිනේ දිනින් දෑ !

ගල්කිස්සේ
සාන්ත තෝමාසු විදු හලේ දී යැ.

## හෙළ දදය

"මුළු රට මෑ අළලා
තෝරා-ගත් සකහල්සෙන්
විවහස් ගොවිතුමන් මහ
සම්මත රජාණන් කොටැ—

'රුහුණේ දනන් උන්
වැස්වූ එ මහ මැඳුරේ
සිවු කොණේ ලෙළ දනෙ' ද
පළඟ ගත්වා දිනිඳු –

ස-දහස් වසරකට
පෙරැ දු රන්නා සෙනෙවිඳු
දඹ දිව් රජුන' ඩක් වද
කොටැ වන් වත'තැ ලෙළැවූ-

'වෙසවුණු හෙළිසුරන්
දෙව් විනිසුරන් පහයෙහි
එ දන් අදන් දිළි දිළෙන
දුටුවන් මන් නුවන් ඇඳූ –

'විදුවා හට පෙරැ
සැබැවින් මැ හිරු ගොනැ වූ
සේළි හෙළ මහ නිරිඳුන්
සෙවුමෙන් පත් ලෝ මුදුන් –

'පංඩුල හෙළෑ' ජරන්
තුන් පුතුන් ශිවි, හෙමි, සඳ
බලිම්සස සොළි සඳහා
ශර-ශියම යන ගෙන-ගිය-

හෙළ දදය යැ එ බඳු
අද දු මෙ නිවස මුදුනේ
හෙළ හුළගේ නටන්නේ
අප හෙළ හඳ දු නටවා."

—ඔවය

## හෙළ බසින් පන්සිල්!

තමම් රුවන් තියා!

තමම් රුවන් තියා!

තමම් රුවන් තියා!

බුදු රුවන් සරණ යෙමි.
දමු රුවන් සරණ යෙමි.
සඟු රුවන් සරණ යෙමි.

දෙ වනු වැත් බුදු රුවන්-
සරණ යෙමි
දෙ වනු වැත් දමු රුවන්-
සරණ යෙමි
දෙ වනු වැත් සඟු රුවන්-
සරණ යෙමි
තෙ වනු වැත් බුදු රුවන්-
සරණ යෙමි
තෙ වනු වැත් දමු රුවන්-
සරණ යෙමි
තෙ වනු වැත් සඟු රුවන්-
සරණ යෙමි

පර පණ නැසුමෙන් –
වළකින්නෙමි
සොරකම් කැරුමෙන් –
වළකින්නෙමි
කාම් මිස හසරින් –
වළකින්නෙමි
බොරු බස් බිණුමෙන් –
වළකින්නෙමි
රහ මෙර පීමෙන් –
වළකින්නෙමි

එඩියෙහි සසාසුවාණන් වෙනුයෙන් අමරසෙන් අහුතුසුවන් විසින්
උණවටුනේ විහිටි ඔවුන් ගේ 'හේළි' පහරුයෙහි පහරවා
පළ කැරිණි.